# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

## ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ද්විතීය පරීක්ෂණය (බාහිර) - 2012
## 2015 මාර්තු - මැයි

## සමාජීය විද්‍යා පීඨය

## ජනසන්නිවේදනය - MACO - E 2015

## භාෂාව හා සන්නිවේදනය

**ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.**

**ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි.** **කාලය : පැය 03 යි.**

---

01. i. භාෂාව යනු කුමක්ද? නිර්වචන පහක් (05) ඇසුරින් පහදන්න. (ලකුණු 10)

ii. ''සිතුවිලි ගොඩනැංවීම හා අදහස් ඒකාබද්ධ කිරීම භාෂාවේ කාර්යයන් අතර වේ.'' භාෂාවේ සමාජ කාර්යභාරය නිදසුන් වශයෙන් ගෙන සාකච්ඡා කරන්න. (ලකුණු 10)

02. ගන්න නෝනා..........ගන්න මහත්තයා.........
මේ බලන්න මම මොනද ගෙනාවේ කියලා......
පොත් පහටම රුපියල් සීයයි
ලයිට් බිල් නෑ.... වතුර බිල් නෑ....
ලාබෙට පොත් මං ළඟ විතරයි.

i. මෙම සමාජ අවස්ථාව නම් කරන්න. (ලකුණු 02)

ii. භාෂා භාවිතයේ ස්වභාවය නිදසුන් වශයෙන් ගෙන ඔබ දන්නා මෙවැනි සමාජ අවස්ථා හතරක් (04) පිළිබඳ විවරණය කරන්න. (ලකුණු 2×4=8)

iii. ''භාෂාව පොදු මෙවලමක් වුණත් සමාජ අවස්ථා අනුව වෙනස් වේ.'' සමාජ අවස්ථාව අනුව භාෂාව වෙනස් වීමෙහි ලා බලපාන සාධක තුනක් (03) නිදසුන් සහිතව ගෙනහැර දක්වන්න. (ලකුණු 10)

03. ''භාෂාව සංස්කෘතියේ කැඩපතයි.''

i. ඔබ මේ ප්‍රකාශය සමග එකඟ වන්නේ ද? නිදසුන් සහිතව ඔබගේ මතය දක්වන්න. (ලකුණු 10)

ii. කෘෂිකාර්මික සංස්කෘතියෙහි භාවිතයට ගැනෙන වචන දහයක් (10) ලියා එහි අර්ථය කෙටියෙන් පහදන්න. (ලකුණු 10)

04. '' විෂය විවිධාංගිකරණය අනුව පුවත්පතෙහි භාෂා ලක්ෂණ වෙනස් වේ.'' තෝරාගත් තීරු ලිපි හා කතුවැකි නිදසුන් වශයෙන් ගෙන ඉහත ප්‍රකාශය පැහැදිලි කරන්න. (ලකුණු 10×2=20)

05. ගාට ගාට ඇවිදින් ඇස් දෙක වහලා හිනාවෙන්න
ආදරේට කොනිත්තලා පැල දොරින් පැන දුවන්න
රැට රැට ඉහ ඉද්දර කොඳුර කොඳුර කවි කියන්න
පාට පාට පන් පැදුරේ මටත් ටිකක් ඉඩ තියන්න...

හාල් ගරන්නත් පුළුවන් වතුර තියන්නත් පුළුවන්
ඇට්ටකුණා වෙන්නේ නැතුව බතක් උයන්නම්
හොදි ඉදන්නත් පුළුවන් කුරු ගාන්නත් පුළුවන්
අඩු ගානේ කිරි හොද්දක් හදල තියන්නම්....

මල් හිටවන්නත් පුළුවන් වල් ගලවන්නත් පුළුවන්
පහන් පැලක් වගේ ගෙපැල සුවඳ කරන්නම්
හොඳට අඩන්නත් පුළුවන් නාඩම ඉන්නත් පුළුවන්
ටික දොහකින් දරු පැටියෙක් තැගි කරන්නම්....

''ජන වහර ඔස්සේ මානව හැඟීම් සියුම් ලෙස නිරූපණය කිරීමේ හැකියාවක් පවතී.'' ඉහත නිර්මාණය ඇසුරින් මේ පිළිබඳව විවරණයක යෙදෙන්න. (ලකුණු 20)

06. i.''පුද්ගල ආධ්‍යාත්මය විවරණය කිරීමෙහි ලා සිනමා රූපය සතු ශක්‍යතාව පුළුල් වූවකි.'' දෙස් -විදෙස් සිනමා නිර්මාණ නිදසුන් වශයෙන් ගෙන පැහැදිලි කරන්න. (ලකුණු 10)

ii. ''සිනමාවේ මූලික ව්‍යාකරණය රූපය යි.'' රූප රාමුවල ස්වභාවය නිදසුන් වශයෙන් ගෙන පහදන්න. (ලකුණු 10)

07. i. ගුවන් විදුලි මාධ්‍යයේ භාවිතයට ගැනෙන විවිධ හඬ ප්‍රභේද පිළිබඳව විවරණයක යෙදෙන්න. (ලකුණු 10)

ii.''ශබ්දය මිනිසාගේ පරිකල්පනය පුළුල් කරයි.'' ගුවන් විදුලි වැඩසටහන් ආකෘතීන්හි භාෂා ලක්ෂණ නිදසුන් වශයෙන් ගෙන පැහැදිලි කරන්න. (ලකුණු 10)

08. පහත සඳහන් මාතෘකා අතරින් හතරක් (04) පිළිබඳ කෙටි සටහන් ලියන්න.

i. භාෂාවේ ප්‍රභවය
ii. ප්‍රාදේශීය ව්‍යවහාර
iii. නිර්මාණය හා භාෂාව
iv. පුවත්පත් සිරස්තල හා භාෂාව
v. දෘශ්‍යීකරණය හා රූප භාෂාව

(ලකුණු 5×4=20)

**************************